# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1853/51 – 2014 මාර්තු 14 වැනි සිකුරාදා – 2012.03.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 65 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/13/2013/එස්/558.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කේඩීඑස්/ඩීඕඑල්/4/4/5/3/17.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ජේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 මාර්තු මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, දොළුව.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකරපහල කෝරළේ සුළු කොට්ඨාසයේ, කුඹල්ඔළුවේවෙල ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2012.12.04 දින පිළියෙල කරන ලද අංක මහ/ඩීඕඑල්/2013/1817 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 සිට 02 දක්වා පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1525ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

01. **කැබලි අංක 01 – පිංකනත් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0250**
උතුරට: ජල මාර්ගය සහ නාරංවිට විහාරාධිපතිට අයත් පිංකනත් කුඹුර; නැගෙනහිරට: නාරංවිට විහාරාධිපතිට අයත් පිංකනත් කුඹුර සහ කැබලි අංක 02; දකුණට: කැබලි අංක 02; බටහිරට: ජල මාර්ගය.

02. **කැබලි අංක 02 – මිණියන්දෙණියේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1275**
උතුරට: ජල මාර්ගය, කැබලි අංක 01 සහ නාරංවිට විහාරාධිපතිට අයත් පිංකනත් කුඹුර; නැගෙනහිරට: ඇළ සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: ජල මාර්ගය සහ කැබලි අංක 01.

03 - 1011